# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,410 - 2024 නොවැම්බර් මස 08 වැනි සිකුරාදා - 2024.11.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2752 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2769 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් මස 29 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 නොවැම්බර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලොටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත විශේෂඥ වෛද්‍ය වෘත්තීන් පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ ඉඳුරාම විශේෂඥ වෛද්‍ය වෘත්තීය නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරාගනු ලබන අයදුම්කරුවන් දින 14 ක කෙටිකාලීන යුද්ධ හමුදා මූලික පාඨමාලාවකට සහභාගි කරවන අතර, ඔවුන් බඳවාගනු ලබන නිලයෙන් අධිකාරියට පත්කොට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාව අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තුවකට/බලකායකට ඇතුළත් කරනු ලැබේ.

3. *විශේෂඥ වෛද්‍ය වෘත්තීන් :*

අ. නිර්වින්දන විශේෂඥ වෛද්‍ය :

(1) ඉඳුරාම ලුතිනන් කර්නල් නිලයෙන් බඳවා ගනු ලබයි.
(2) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයටම ම අයදුම් කළ හැකිය.
(3) 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.
(4) කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය ආයතනය වෙතින් සහතිකලත් නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරයෙකු විය යුතුය.
(5) වෛද්‍ය වෘත්තියේ අවම වශයෙන් වසර 10 ක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

ආ. ශල්‍ය විශේෂඥ වෛද්‍ය :

(1) ඉඳුරාම ලුතිනන් කර්නල් නිලයෙන් බඳවා ගනු ලබයි.
(2) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.
(3) 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.
(4) කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය ආයතනය වෙතින් සහතිකලත් ශල්‍ය විශේෂඥ වෛද්‍යවරයෙකු විය යුතුය
(5) වෛද්‍ය වෘත්තියේ අවම වශයෙන් වසර 10 ක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

ඇ. මානසික රෝග විශේෂඥ වෛද්‍ය :

(1) ඉඳුරාම ලුතිනන් කර්නල් නිලයෙන් බඳවා ගනු ලබයි.
(2) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.
(3) 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.
(4) කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය ආයතනය වෙතින් සහතිකලත් මානසික රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු විය යුතුය.
(5) වෛද්‍ය වෘත්තියේ අවම වශයෙන් වසර 10 ක සේවා කාලයක් සපුරා තිබිය යුතුය

ඈ. ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍ය :

(1) ඉඳුරාම ලුතිනන් කර්නල් නිලයෙන් බඳවා ගනු ලබයි.
(2) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.
(3) 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය
(4) කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය ආයතනය වෙතින් සහතිකලත් ප්‍රසව හා නාරිවේද විශේෂඥ වෛද්‍යවරයෙකු විය යුතුය.
(5) වෛද්‍ය වෘත්තියේ අවම වශයෙන් වසර 10 ක සේවා කාලයක් සපුරා තිබිය යුතුය.

ඉ. දන්ත සංරක්ෂණ විශේෂඥ වෛද්‍ය :

(1) ඉඳුරාම ලුතිනන් කර්නල් නිලයෙන් බඳවා ගනු ලබයි.
(2) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.

(3) 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය
(4) ශ්‍රී ලංකාවේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය (PGIM) විසින් අනුමත කරන ලද MD පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අදාළ දන්ත විශේෂඥතාව පිළිබඳ විශේෂඥයකු විය යුතුය.
(5) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ආයතනයේ විශේෂඥ දන්ත වෛද්‍යවරයෙකු වශයෙන් අනුමැතිය ලබා තිබීම.
(6) දන්ත වෛද්‍ය වෘත්තියේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් සපුරා තිබිය යුතුය.

ඊ. විකලාංග විශේෂඥ දන්ත වෛද්‍ය :

(1) ඉඳුරාම ලුතිනන් කර්නල් නිලයෙන් බඳවා ගනු ලබයි.
(2) ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.
(3) 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.
(4) ශ්‍රී ලංකාවේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය (PGIM) විසින් අනුමත කරන ලද MD පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අදාළ දන්ත විශේෂඥතාව පිළිබඳ විශේෂඥයකු විය යුතුය.
(5) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ආයතනයේ විශේෂඥ දන්ත වෛද්‍යවරයෙකු වශයෙන් අනුමැතිය ලබා තිබීම.
(6) දන්ත වෛද්‍ය වෘත්තියේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක් තිබිය යුතුය.

4. මූලික සුදුසුකම් :

අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය :

| | | | |
|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය. |
| ආ. | වයස | : | අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස ඒ ඒ වෘත්තීන් යටතේ දක්වා ඇති පරිදි වේ. |
| ඇ. | උස : | | |
| | (1) පිරිමි | : | උස අඩි 5 යි අඟල් 6 ට නොඅඩු විය යුතුය. |
| | (2) ගැහැණු | : | උස අඩි 5 යි අඟල් 3 ට නොඅඩු විය යුතුය. |
| ඈ. | බර : | | |
| | (1) පිරිමි | : | බර කිලෝ ග්‍රෑම් 55 ට නොඅඩු විය යුතුය. |
| | (2) ගැහැණු | : | බර කිලෝ ග්‍රෑම් 45 ට නොඅඩු විය යුතුය. |
| ඉ. | පපුව : පිරිමි | : | අඟල් 32 ට නොඅඩු විය යුතුය. |
| ඊ. | ශරීර ස්කන්ධ දර්ශකය | : | 18.5 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතුය. |
| උ. | වෛද්‍ය පරීක්ෂණය | : | යුද්ධ හමුදා රෝහල වෙතින් පවත්වනු ලබන පූර්ණ වෛද්‍ය පරීක්ෂණය සඳහා සහභාගි වී ඉන් සමත්විය යුතුය. |
| ඌ. | සිවිල් තත්ත්වය | : | විවාහක/අවිවාහක |

5. සේවා කොන්දේසි :

අ. බඳවා ගැනීමෙන් පසු කෙටි කාලීන මූලික හමුදා පුහුණු පාඨමාලාවක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ දී හැදෑරිය යුතුය.

ආ. යුද්ධ හමුදාධිපතිතුමන් විසින් තීරණය කරනු ලබන පරිදි බඳවා ගනු ලබන නිලධාරින්/නිලධාරිනියන් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක රාජකාරි/පුහුණුවීම් සඳහා අනුයුක්ත කරනු ලැබීමකට යටත් විය යුතුය.

ඇ. පුහුණුවීමේ කාලය තුළ දී පමණක් කෙඩෙට් නිලධාරින්ගේ තරාතිරම සෙසු නිලයින් හා සමානවන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් විය යුතුය.

ඇ. රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තු, සංස්ථා, සිවිල් ආයතනය හා පුද්ගලික ආයතනයන් හි රාජකාරියේ නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් බඳවා ගැනීමට තෝරා ගතහොත් පූර්ණ කාලීනව යුද්ධ හමුදා සේවයට නිදහස් කළ හැකි බවට අදාළ ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්ත, සංස්ථා, සිවිල් ආයතනය) විසින් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

ඉ. වෘත්තීය නිලධාරීන් වශයෙන් බඳවාගනු ලබන නිලධාරී/නිලධාරිණියන් හමුදා නියෝග (12/2019) උපදෙස් හා වෙනත් වෘත්තීය නිලධාරී බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියේ සඳහන් සුදුසුකම් මත අදාළ නිලය සඳහා බඳවා ගනු ලබයි.

ඊ. විශේෂඥ වෛද්‍ය නිලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ අත්සන් තබන ලද ඇප බැඳුම්කරය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පවරා ගනු ලබන අතර, ආරම්භක සේවා කාලය වසර 05 ක් වන අතර, සේවය තවදුරටත් දීර්ඝ කරන්නේ නම් එය වාර්ෂිකව සිදු කරනු ලබයි.

6. වැටුප් හා දීමනා.-ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන්ට අදාළවන වැටුප් තල/ පරිමාණයන් පහත සඳහන් පරිදි වේ.

| අ/අ | නිලය | *රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛ 3/2016 ට අනුව* | | |
|---|---|---|---|---|
| | | *ඒකාබද්ධ වැටුප 2020 වර්ෂයේ සිට* | *වැටුප් වර්ධක 2020.01.01 දින සිට* | *උපරිම ඒකාබද්ධ වැටුප* |
| 1 | දෙවන ලුතිනන් | රු. 41,905.00 | - | - |
| 2 | ලුතිනන් | රු. 47,615.00 | 30 x 1335 (වාර්ෂික) | රු. 87,665.00 |
| 3 | කපිතාන් | රු. 55,625.00 | 24 x 1335 (වාර්ෂික) | රු. 87,665.00 |
| 4 | මේජර් | රු. 60,965.00 | 22 x 1335 (වාර්ෂික) | රු. 90,335.00 |
| 5 | ලුතිනන් කර්නල් | රු. 62,595.00 | 22 x 1630 (වාර්ෂික) | රු. 98,455.00 |
| 6 | කර්නල් | රු. 76,175.00 | 17 x 2170 (වාර්ෂික) | රු. 113,065.00 |
| 7 | බ්‍රිගේඩියර් | රු. 80,515.00 | 15 x 2170 (වාර්ෂික) | රු. 113,065.00 |
| 8 | මේජර් ජෙනරාල් | රු. 88,000.00 | 12 x 2700 (වාර්ෂික) | රු. 120,400.00 |
| 9 | ලුතිනන් ජෙනරාල් | රු. 93,400.00 | 10 x 2700 (වාර්ෂික) | රු. 120,400.00 |
| 10 | ජෙනරාල් | රු. 101,500.00 | 7 x 2700 (වාර්ෂික) | රු. 120,400.00 |

7. අනෙකුත් දීමනාඃ

අ. පහත සඳහන් දීමනා මූලික වැටුපට අමතරව මාසිකව ගෙවනු ලබයි. ඃ

(1) සුදුසුකම් දීමනා.
(2) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව.
(3) වික්ෂෙපණ දීමනාව (විවාහක නිලධාරීන් කඳවුර ඇතුළත විසීමට නියෝග ලබා සිටින විට) විවාහක නිලධාරීන්ට පමණක් හිමිවේ.
(4) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව.
(5) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් අනුමතකර ඇති දීමනා.

ආ. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේඃ

(1) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.
(2) කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී දීමනාව.
(3) නොමිලේ නිල ඇඳුම්.
(4) විවාහක නිලධාරී/නිලධාරිනියන් හට අනුගාමික දීමනා හා අවිවාහක නිලධාරීන්/ නිලධාරිනියන් හට අනුගාමික සේවය.
(5) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරීන්ට රාජකාරී ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරී දුම්රිය බලපතක්.

8. වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරීන්/නිලධාරිනියන් හට බලපවත්වනු ලබයි ඃ

අ. යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

ආ. 1993 අගෝස්තු මස 17 වන දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බලසේනා) සේවා නියෝගය.

ඇ. 1989 ජූනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

9. මෙහි පහත 10 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි දෙමව්පියන්, කලත්‍රයා හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළ යුතු වන අතර, එය අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ. තෝරාගත් අපේක්ෂකයින්ගේ දෙමව්පියන්, කලත්‍රයා හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. විශේෂ අවස්ථාවල දී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරිගේ භාරකරු පියා විය යුතුය. ඔහු නොමැති නම් පමණක් මවට, කලත්‍රයාට හෝ භාරකරුහට භාරකාරිත්වය හිමිවනු ලැබේ.

10. අයදුම්කරුගේ මව, පියා, කලත්‍රයා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි ඉල්ලුම්කරුවෙකු වන ...............................................................................ගේ පියා/මව/කලත්‍රයා/ භාරකරු මම වෙමි.

ආ. ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමි.

(1) පුහුණුවීමේ කාලසීමාව තුළ දී අයදුම්කරුහට දරන්නට වන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන්ම අධිකාරය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වළක්වාලිය හැකි හේතූන් හෝ නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

*නොගැලපෙන වචන කපා හරින්න.

————,
මව/පියා/කලත්‍රයා/භාරකරුගේ අත්සන.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :————.

දිනය :————.

සාක්ෂිකරුගේ අත්සන :————.

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :————.

11. *භාෂා අවශ්‍යතා.*- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතුවේ.

12. *අනන්‍යතාවය තහවුරු කිරීම.*- අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 'වියදුරු බලපත්‍රය' පිළිගනු ලැබේ.

13. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් බඳවා ගැනීමට තෝරා ගතහොත් එම අපේක්ෂකයා සේවයෙන් මුදවාලිය හැකි බවට සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ලබා දිය යුතුය.

14. ඉල්ලුම් පත්‍ර.- ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේම අත් අකුරින් ලියා 2024 නොවැම්බර් මස 16 දින 1200 පැයට හෝ ඊට පෙර ලැබෙන සේ 'පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ' යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහල කෙලවරේ 'යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ විශේෂඥ වෛද්‍ය වෘත්තීය නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය' යනුවෙන් සඳහන් කළ යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මඟින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක් ද සිදුකරනු නොලබන අතර, වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

15. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ලබාදිය යුතුය :

අ. උප්පැන්න සහතිකය.
ආ. ඉල්ලුම්කර ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික.
ඇ. පාසල් හැරයාමේ සහතිකය.
ඈ. ග්‍රාම නිලධාරි සහතිකය.
ඉ. පොලිස් නිශ්කාෂණ සහතිකය.
ඊ. උපාධි සහතිකය.
උ. වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතිකය.
ඌ. ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.

එ. අයදුම්කරුව හඳුනනු ලබන චරිත සහතිකයක් නිකුත් කිරීමට සුදුසුකම් සහිත පුද්ගලයන් දෙදෙනෙකු වෙතින් මෑතක දී ලබාගන්නා ලද චරිත සහතික දෙකක් හා අයදුම්කරු අවසානවරට ඉගෙනීම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබාගන්නා ලද චරිත සහතිකයක්.

ඒ. අදාළ වෙනත් සහතික.

ක. තවද, ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ද මෑතක දී ලබාගත් 2" x2 1/2" ප්‍රමාණයේ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු මඟින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.

16. *සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම*.- ඉහත සඳහන් අවශ්‍යතාවන් සපුරාලන ලද තෝරාගත් අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරීක්ෂණ සඳහා පෙනී සිට සමත් වීමෙන් පසු පමණක් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පත් කරනු ලබන මණ්ඩලයක් මඟින් අවසාන තෝරා ගැනීම සිදුකරනු ලබයි.

17. සම්මුඛ පරීක්ෂණ සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්හට සම්මුඛ පරීක්ෂණයන් පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් තැපැල මගින් දැනුම් දෙනු ලැබේ. අදාළ සම්මුඛ පරීක්ෂණ ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ දී පැවැත්වීමට කටයුතු සිදු කරන අතර, අයදුම්කරුවන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනයම් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ආපසු ගෙවනු නොලැබේ.

18. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙන් පමණක් වන අතර, අයදුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ දැරීම අදාළ අපේක්ෂකයා නුසුදුස්සෙකු ලෙස පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

19. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් සම්බන්ධව දැනුවත් නොකරනු ලබන අතර, එවැනි අයදුම්කරුවන්ගෙන් කරුණු ඉදිරිපත් කිරීම් භාරගනු නොලැබේ.

*සටහන* : මෙම *ගැසට් නිවේදනය* සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවක් ඇති වුවහොත්, එවැනි අවස්ථාවල දී සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

එච්. එල්. වී. එම්. ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර,
කොළඹ.
2024 ඔක්තෝබර් මස 21 වැනි දින

11-135/1

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත ඉඳුරාම වෘත්තීය නිලධාරී පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ පහත සඳහන් වෙනත් වෘත්තීය නිලධාරී පුරප්පාඩු වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලබයි:

*අ.* දන්ත වෛද්‍ය
*ආ.* තොරතුරු තාක්‍ෂණ
*ඇ.* සිවිල් ඉංජිනේරු
*ඈ.* විදුලි ඉංජිනේරු
*ඉ.* යාන්ත්‍රික ඉංජිනේරු
*ඊ.* විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු
*උ.* ගෘහ නිර්මාණ ශිල්පි
*ඌ.* මිනින්දෝරු
*එ.* ගණකාධිකාරි
*ඒ.* ශබ්ද පරිපාලන ඉංජිනේරු
*ඔ.* නර්තන කණ්ඩායම් (සංස්කෘතික නර්තන)
*ඕ.* මනෝ විද්‍යා.

2. තෝරාගනු ලබන අයදුම්කරුවන් හට මාස 04 ක කෙටි කාලීන යුද්ධ හමුදා මූලික පාඨමාලාවකට සහභාගි කරවන අතර, ඔවුන් බඳවාගනු ලබන නිලයෙන් අධිකාරියට පත්කොට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් අනුව යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ රෙජිමේන්තු/බලකා වෙත ඇතුළත් කරනු ලබයි.

3. *මූලික සුදුසුකම් :*

අ. පුරවැසිභාවය : ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.
ආ. අවිවාහක/අවිවාහක බව : වෘත්තීන්ට අදාළව දක්වා ඇති පරිදි වේ.
ඇ. වයස : අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අදාළ වෘත්තීන් යටතේ දක්වා ඇති පරිදි වේ.
ඈ. උස :
(1) පිරිමි : උස අඩි 5 යි අඟල් 6 ට නොඅඩු විය යුතුය.
(2) ගැහැණු : උස අඩි 5 යි අඟල් 3 ට නොඅඩු විය යුතුය.
ඉ. බර :
(1) පිරිමි : බර කිලෝ ග්‍රෑම් 55 ට නොඅඩු විය යුතුය.
(2) ගැහැණු : බර කිලෝ ග්‍රෑම් 45 ට නොඅඩු විය යුතුය.
ඊ. පපුව : පිරිමි : අඟල් 32 ට නොඅඩු විය යුතුය.
උ. ශරීර ස්කන්ධ දර්ශකය : 18.5 $Kg/m^2$ – 25 $Kg/m^2$ ත් අතර විය යුතුය.
ඌ. වෛද්‍ය පරීක්‍ෂණය : යුද්ධ හමුදා රෝහල වෙතින් පවත්වනු ලබන පූර්ණ වෛද්‍ය පරීක්‍ෂණය සඳහා සහභාගී කරවන අතර ඉන් සමත්විය යුතුය.
එ. දෘෂ්ටී දර්ශනය : උපැස් රහිතව දකුණු ඇස 6/6 ලෙසත් වම් ඇස 6/9 විය යුතුයි. තවද, දෘෂ්ටී දර්ශනය 6/18 ලෙස පවතින අවස්ථාවල දී උපැස් මගින් දකුණු ඇස දෘෂ්ටී දර්ශනය 6/6 ලෙසත් වම් ඇස දෘෂ්ටී දර්ශනය 6/9 ලෙසත් නිවැරදි කළ හැකි අයදුම්කරුවන් තෝරාගැනීමට සලකා බලනු ලැබේ.

4. *මූලික අධ්‍යාපන සුදුසුකම් :*

අ. අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනක දී එකවර විෂයන් තුනක් සමත්වීම (සාමාන්‍ය සාමාර්ථ) සහ සාමාන්‍ය පොදු පරීක්‍ෂණය සඳහා 30% ප්‍රතිශතයක් ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රවේශය "YES" ලෙස සඳහන්ව තිබීම;

*හා*

ආ. අ.පො.ස (සා/පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී එකවර විෂයන් පහකට (05) සම්මාන සාමාර්ථ සමග විෂයන් අටක් (08) සමත්වීම හා තෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය, හා සිංහල/දෙමළ විෂයන් සඳහා සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ (S) පමණක් ලබා ඇති අයදුම්කරුවන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් NVQ Level IV මට්ටමේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අධ්‍යාපන ආයතනයක් මගින් ඩිප්ලෝමා/උපාධි පාඨමාලාවක් හදාරා තිබීම (NVQ සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය).

*හෝ*

*ඇ.* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පිළිගනු ලබන අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) විභාගයන්ට සමාන ජාත්‍යන්තර විභාගයකින් (Pearson Edexcel, GCSE, GCE හා Cambridge හෝ වෙනත්) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය. (ඉහත අනිවාර්යය විෂයයන් ද ඇතුළුව).

5. *වෙනත් සුදුසුකම් :* ජාත්‍යන්තර/ජාතික/පළාත්/දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා, නායකත්ව, වෙනත් ජයග්‍රහණ සහ වෙනත් භාෂා (සිංහල හා ඉංග්‍රීසි හැර) හැසිරවීම විශේෂ සුදුසුකම් ලෙස සලකා බලනු ලැබේ.

6. *පොදු උපදෙස් :*

*අ.* පුහුණුවීම් ලබන කාලය තුළ දී කෙඩෙට් නිලධාරීන් හට විවාහ වීමට අවසර දෙනු නොලැබේ. (අවිවාහක වෘත්තීන්ට අදාළ කෙඩෙට් නිලධාරීන් හට පමණක්).

*ආ.* මනා ශාරීරික සෞඛ්‍ය තත්වයෙන් සිටිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් බඳවාගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, ඉන් සමත් විය යුතුය.

7. *දන්ත වෛද්‍ය නිලධාරී (කපිතාන්) :*

*අ.* විවාහක/අවිවාහක දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.
*ආ.* ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.
*ඇ.* 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
*ඈ.* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත දේශීය විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් දන්ත වෛද්‍ය උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විදේශීය විශ්වවිද්‍යාලයකින් දන්ත වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතුය.
*ඉ.* දන්ත වෛද්‍යවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

8. දන්ත වෛද්‍ය නිලධාරී (ලුතිනන්) :

අ. අවිවාහක පුද්ගලයින්ට පමණක් අයදුම් කළ හැකිය.
ආ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.
ඈ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත දේශීය විශ්වවිද්‍යාලයක් වෙතින් ලබාගත් දන්ත වෛද්‍ය උපාධියක් ලබා තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විදේශීය විශ්වවිද්‍යාලයකින් දන්ත වෛද්‍ය උපාධියක් ලබා තිබිය යුතුය.

9. තොරතුරු තාක්ෂණ නිලධාරී (කපිතාන්) :

<table>
<tr><th>අ.අ</th><th>බඳවා ගනු ලබන වෘත්තීය</th><th>සුදුසුකම්</th></tr>
<tr><td>1</td><td>මෘදුකාංග ඉංජිනේරු</td><td rowspan="10">ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.<br><br>විවාහක/අවිවාහක දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.<br><br>2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් දේශීය/විදේශීය විශ්වවිද්‍යාලයක් වෙතින් අදාළ විෂය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබිය යුතුය.<br><br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2½ ට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය. (අධ්‍යන හා සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).<br><br>අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.</td></tr>
<tr><td>2</td><td>ජාලකරණ ඉංජිනේරු</td></tr>
<tr><td>3</td><td>දෘඩාංග ඉංජිනේරු</td></tr>
<tr><td>4</td><td>තොරතුරු තාක්‍ෂණ විශ්ලේෂක</td></tr>
<tr><td>5</td><td>තොරතුරු තාක්ෂණ විගණක</td></tr>
<tr><td>6</td><td>ජාල ආරක්‍ෂක ඉංජිනේරු</td></tr>
<tr><td>7</td><td>සයිබර් ආරක්‍ෂණ විශේෂඥ</td></tr>
<tr><td>8</td><td>සයිබර් අපරාධ විශ්ලේෂක</td></tr>
<tr><td>9</td><td>සිදුවීම් විශ්ලේෂක ප්‍රතිචාරක</td></tr>
<tr><td>10</td><td>දෘෂ්‍ය සන්නිවේදන ඉංජිනේරු</td></tr>
</table>

10. සිවිල් ඉංජිනේරු (කපිතන්) :

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.
ආ. විවාහක/අවිවාහක දෙපාර්ශ්වයටම අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුයි.
ඈ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාවේදී/තාක්ෂණවේදී සිවිල් ඉංජිනේරු උපාධි පාඨමාලාව සමත්වීම.
ඉ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2½ ට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය. (අධ්‍යන හා සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).
ඊ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විභාගයේ පළමු කොටස සම්පූර්ණ කිරීම හා (පැරණි විෂයය නිර්දේශය) යටතේ දෙවන කොටස විභාගයේ ප්‍රතිඵල අපේක්ෂිත හෝ පළවන හා දෙවන කොටස සාර්ථකව නිමකර තුන්වන කොටසේ (නව විෂය නිර්දේශය) විභාගය සමත් වී තිබිය යුතුය.
උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධිය හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

11. සිවිල් ඉංජිනේරු (ලුතිනන්) :

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.
ආ. අවිවාහක පුද්ගලයින්ට පමණක් අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.
ඈ. ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES), උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE), ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) මොරටුව විශ්වවිද්‍යාලය වෙතින් හෝ ඉංජිනේරු තාක්ෂණ ආයතනය මට්ටක්කුලිය වෙතින් හදාරා තිබිය යුතුය.
ඉ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (අධ්‍යන සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).
ඊ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විභාගයේ පළමු කොටස සම්පූර්ණ කිරීම හා (පැරණි විෂය නිර්දේශය) යටතේ දෙවන කොටස විභාගයේ ප්‍රථිඵල අපේක්ෂිත හෝ පළවන හා දෙවන කොටස සාර්ථකව නිමකර තුන්වන කොටසේ (නව විෂය නිර්දේශය) විභාගයෙන් සමත්වී තිබිය යුතුය.
උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

12. විදුලි ඉංජිනේරු (කපිතන්):

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.
ආ. විවාහක/අවිවාහක දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුයි.
ඈ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාවේදී/තාක්ෂණවේදී විදුලි ඉංජිනේරු උපාධි පාඨමාලාවක් ලබා තිබීම.
ඉ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2½ ට වැඩි පළපුරුද්දක් තිබිය යුතුයි. (අධ්‍යන සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).
ඊ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විභාගයේ පළමු කොටස සම්පූර්ණ කිරීම හා පැරණි විෂය නිර්දේශය යටතේ දෙවන කොටස විභාගයේ ප්‍රතිඵල අපේක්ෂිත හෝ පළවන හා දෙවන කොටස සාර්ථකව නිමකර තුන්වන කොටසේ (නව විෂය නිර්දේශය) විභාගයෙන් සමත්වී තිබිය යුතුය.
උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

13. විදුලි ඉංජිනේරු (ලුතිනන්) :

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.
ආ. අවිවාහක පුද්ගලයින්ට පමණක් අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 28 ට වැඩි විය යුතුයි.
ඈ. ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES), උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE), ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) මොරටුව විශ්වවිද්‍යාලය වෙතින් හෝ ඉංජිනේරු තාක්ෂණ ආයතනය මට්ටක්කුලිය වෙතින් හදාරා තිබිය යුතුය.

ඉ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (අධ්‍යන/සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

ඊ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විභාගයේ පළමු කොටස සම්පූර්ණ කිරීම හා පැරණි විෂය නිර්දේශය යටතේ දෙවන කොටස විභාගයේ ප්‍රතිඵල අපේක්ෂිත හෝ පළවන හා දෙවන කොටස සාර්ථකව නිමකර තුන්වන කොටසේ (නව විෂය නිර්දේශය) විභාගයෙන් සමත්ව තිබිය යුතුය.

උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

14. යාන්ත්‍රික ඉංජිනේරු (කපිතන්)ඃ

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයටම අයදුම් කළ හැකිය .

ආ. විවාහක/අවිවාහක දෙපාර්ශ්වයටම අයදුම් කළ හැකිය.

ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුයි.

ඈ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාවේදී/තාක්‍ෂණවේදී යාන්ත්‍රික ඉංජිනේරු උපාධි පාඨමාලාවක් ලබා තිබීම.

ඉ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විභාගයේ පළමු කොටස සම්පූර්ණ කිරීම හා පැරණි විෂයය නිර්දේශය යටතේ දෙවන කොටස විභාගයේ ප්‍රතිඵල අපේක්ෂිත හෝ පළවන හා දෙවන කොටස සාර්ථකව නිමකර තුන්වන කොටසේ (නව විෂය නිර්දේශය) විභාගයෙන් සමත්වී තිබිය යුතුය.

ඊ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වසයෙන් වසර 2½ ට වැලූ පළපුරුද්දක් තිබිය යුතුයි. (අධ්‍යයන/සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

15. යාන්ත්‍රික ඉංජිනේරු (ලුතිනන්) ඃ

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.

ආ. අවිවාහක පුද්ගලයින්ට පමණක් අයදුම් කළ හැකිය.

ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.

ඈ. ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES), උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE), ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) මොරටුව විශ්වවිද්‍යාලය වෙතින් හෝ ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය මට්ටක්කුලිය වෙතින් හදාරා තිබිය යුතුය.

ඉ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විභාගයේ පළමු කොටස සම්පූර්ණ කිරීම හා පැරණි විෂය නිර්දේශය යටතේ දෙවන කොටස විභාගයේ ප්‍රථිඵල අපේක්ෂිත හෝ පළවන හා දෙවන කොටස සාර්ථකව නිමකර තුන්වන කොටසේ (නව විෂය නිර්දේශය) විභාගයේ සමත්ව තිබිය යුතුය.

ඊ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුයි (අධ්‍යයන/සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

16. ගෘහ නිර්මාණ ශිල්පි (කපිතන්) ඃ

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.

ආ. විවාහක/අවිවාහක දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.

ඇ. 2024 නොවැම්බර් මස 08 වැනි දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුයි.

ඈ. මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන නිර්මිත පරිසරය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ වාස්තු විද්‍යා විද්‍යාවේ දී උපාධිය හෝ නගර හා දේශ සැලසුම් විද්‍යාවේදී උපාධිය හෝ භූ සැලසුම්කරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සමත්වීම

*හෝ*

ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන වාස්තු විද්‍යාව පිළිබඳ වෘත්තීයමය පරීක්‍ෂණයේ I හා II අදියර සමත්වීම

*හෝ*

ඉ. ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය විසින් පිළිගත් ඒ හා සමාන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

ඊ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2½ ට වැඩි පළපුරුද්දක් තිබිය යුතුයි (අධ්‍යයන/සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

17. ගෘහ නිර්මාණ ශිල්පි (ලුතිනන්)፡

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයටම ම අයදුම් කළ හැකිය.
ආ. අවිවාහක පුද්ගලයින්ට පමණක් අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.
ඈ. නිර්මිත පරිසරය පිළිබඳ වාස්තු විද්‍යාව, නගර හා දේශ සැලසුම් හෝ භූ සැලසුම්කරණය පිළිබද ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES), උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE), ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) මොරටුව විශ්වවිද්‍යාලය වෙතින් හෝ ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය මට්ටක්කුලිය වෙතින් හදාරා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය මගින් පවත්වනු ලබන වාස්තු විද්‍යාව පිළිබඳ වෘත්තීයමය පරීක්‍ෂණයේ I හා II අදියර සමත්වීම.
ඉ. ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය විසින් පිළිගත් ඒ හා සමාන වෙනත් සුදුසුකම් ලබාතිබීම.
ඊ. පිළිගත් ආයතනයක අදාළ ක්‍ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුය. (අධ්‍යන/සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).
උ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

18. මිනින්දෝරු (කපිතන්)፡

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට අයදුම් කළ හැකිය.
ආ. විවාහක/අවිවාහක දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
ඈ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යාවේදී මිනින්දෝරු උපාධි පාඨමාලාව සමත්වීම

හෝ

දියතලාව මැනුම් සහ සිතියම්කරණ ආයතන මගින් පවත්වනු ලබන මිනින්දෝරු පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සමත්වීම.

ඉ. පිළිගත් ආයතනයක අදාළ ක්‍ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2½ ට වැඩි පළපුරුද්දක් තිබිය යුතුයි. (අධ්‍යන/සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

ඊ. අදාළ විෂය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

19. මිනින්දෝරු (ලුතිනන්) ፡

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයටම අයදුම්කළ හැක.
ආ. අවිවාහක පුද්ගලයින්ට පමණක් අයදුම්කළ හැක.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.
ඈ. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යාවේදී මිනින්දෝරු උපාධි පාඨමාලාව සමත්වීම;

*හෝ*

ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාව (NDES), උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE), ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (NDT) රජයේ පිළිගත් ආයතනයක හදාරා ඉන් සමත්ව තිබීම;

ඉ. පිළිගත් ආයතනයක අදාළ ක්‍ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුයි (අධ්‍යන/සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

ඊ. අදාළ විෂයය පිළිබඳ විශේෂිත සහතිකපත්‍ර හා පශ්චාත් උපාධියක් හදාරා තිබීම හෝ හදාරමින් සිටීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

20. විද්‍යුත් හා යාන්ත්‍රික ඉංජිනේරු (ලුතිනන්) ඃ

අ. පිරිමි පුද්ගලයින් සඳහා පමණක් අයදුම් කළ හැකිය.
ආ. අවිවාහක පුද්ගලයින් පමණක් අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.
ඈ. මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණ විද්‍යා ඩිප්ලෝමාව (NDT) (යාන්ත්‍රික ඉංජිනේරු) සමත්වීම;

හෝ

මට්ටක්කුලිය උසස් තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDE) (යාන්ත්‍රික ඉංජිනේරු) සමත්වීම

හෝ

කටුනායක ඉංජිනේරු තාක්‍ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (NDES) (යාන්ත්‍රික ඉංජිනේරු) සමත්වීම

හෝ

විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික තාක්‍ෂණික සහතික පත්‍ර විභාගය (NCT) සමත්වීම හා වසර 05 ක අදාළ ක්‍ෂේත්‍රයේ පළපුරුද්ද

හෝ

සිටි ඇන්ඩ් ගිල්ඩ් ආයතනය වෙතින් උසස් තාක්‍ෂණ ඩිප්ලෝමාව (යාන්ත්‍රික) IVQ - Level 05 සමත්වීම;

හෝ

ශ්‍රී ලංකා ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ ජාතික වෘත්තීය සුදුසුකම (යාන්ත්‍රික) NVQ - Level 06 සමත්වීම හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික) සමත්වීම;

හෝ

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) ශ්‍රී ලංකා ඉංජිනේරු අනුබද්ධ ආයතනය (IIESL) මගින් පිළිගත් වෙනත් ආයතනයන් හි ඒ හා සමාන සුදුසුකම් සහිත පාඨමාලාවන් හදාරා ඉන් සමත් වී තිබීම.

ඉ. ඉහත සඳහන් කර ඇති ඩිප්ලෝමා (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ වෘත්තීය පුහුණු අධිකාරියේ අනුමත ආයතනයක හදාරන ලද) වලට සමාන හෝ පිළිගත හැකි ඉහළ වෙනත් සුදුසුකම්.

21. ගණකාධිකාරී (කපිතන්) ඃ

අ. පිරිමි පුද්ගලයින් සඳහා පමණක් අයදුම් කළ හැකිය.
ආ. විවාහක/අවිවාහක දෙපාර්ශ්වයට ම අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
ඈ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් අනුමත විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණය/ මූල්‍ය සම්බන්ධ විශේෂ උපාධියක් (විද්‍යාවේදී විශේෂ ගණකාධිකරණය/ මූල්‍ය කළමණාකරණය, ව්‍යාපාර පරිපාලනවේදී විශේෂ ගණකාධිකරණය/ මූල්‍ය, ව්‍යාපාර කළමණාකරණවේදී විශේෂ ගණකාධිකරණය/මූල්‍ය, වාණිජ්‍යවේදී විශේෂ) ලබා තිබීම.;

හා

වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CA Sri Lanka) ව්‍යාපාර අදියර - II (Business Level II) හෝ ඊට සමාන සුදුසුකම් හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CIMA - UK) කළමනාකරණ අදියර (Managerial Level) සමත්ව තිබීම

හෝ

සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CMA - SL) කළමනාකරණ අදියර (Managerial Level) හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ ( ACCA - UK) කුසලතා අදියර (Skills Level) සමත්ව තිබීම.

ඊ. පිළිගත් ආයතනයක ගිණුම්කරණය/මූල්‍ය/විගණනයට අදාළ ක්‍ෂේත්‍රයන්හි අවම වශයෙන් වසර 2½ ට වැඩි පළපුරුද්දක් තිබිය යුතුයි. (අධ්‍යන සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

22. ශබ්ද පරිපාලන ඉංජිනේරු නිලධාරී (කපිතන්)ඃ

අ. පිරිමි පුද්ගලයින් සඳහා පමණක් අයදුම් කළ හැකිය.
ආ. විවාහක/අවිවාහක දෙපාර්ශවයටම අයදුම් කළ හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
ඈ. ශ්‍රී ලංකාවේ හෝ විදේශ විශ්වවිද්‍යාල (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත) විද්‍යාවේදි ශබ්ද පරිපාලන ඉංජිනේරු උපාධියක් හෝ ඒ හා සමාන ශබ්ද පරිපාලන උපාධියක් තිබීම අවශ්‍යයි.
ඉ. පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 2½ ට වැඩි අත්දැකීම අවශ්‍ය වේ (අධ්‍යන සීමාවාසික පුහුණුව පළපුරුද්ද ලෙස නොසැලකේ).

23. සංස්කෘතික නර්ථන කණ්ඩායම් නිලධාරී (කපිතන්)ඃ

අ. පිරිමි පුද්ගලයින් සඳහා පමණක් අයදුම් කළ හැකිය.
ආ. විවාහක/අවිවාහක දෙපාර්ශවයට අයදුම් කල හැකිය.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතුය.
ඈ. ශ්‍රී ලංකාවේ හෝ විදේශ විශ්වවිද්‍යාලයක (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත) සිව් (04) අවුරුදු පූර්ණ කාලීන ශාස්ත්‍රවේදී/ලලිතකලා නර්තන මූලික උපාධියක් හදාරා තිබීම අවශ්‍යයි.
ඉ. පිළිගත් ආයතනයක නර්තන පිළිබඳව ප්‍රායෝගික පළපුරුද්ද (සංදර්ශනවලට සහභාගිවීම/නර්තන නිර්මාණ) හෝ යම් ආයතනයක නර්තන ඉගැන්වීම හා ඊට අදාළව වසර 2½ ට වැඩි පළපුරුද්ද අවශ්‍ය වේ.

24. සංස්කෘතික නර්ථන නිලධාරී (ලුතිනන්)ඃ

අ. පිරිමි පුද්ගලයින් සඳහා පමණක් අයදුම් කළ හැකිය.
ආ. අවිවාහක විය යුතුයි.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.
ඈ. ශ්‍රී ලංකාවේ හෝ විදේශ විශ්වවිද්‍යාල (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත) වසර (03) පූර්ණ කාලීන ශාස්ත්‍රවේදී/ලලිතකලා නර්තන මූලික උපාධියක් හදරා තිබීම අවශ්‍යයි.

හෝ

ඉ. ශ්‍රී ලංකාවේ හෝ විදේශ විශ්වවිද්‍යාල (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත) වසර 03 ක ලලිතකලා නර්තන ඩිප්ලෝමාවක් හදාර තිබීම අවශ්‍යයි.

ඊ. පිළිගත් ආයතනයක නර්තන පිළිබඳව ප්‍රායෝගික පළපුරුද්ද (සංදර්ශන වලට සහභාගී වීම/නර්තන නිර්මාණ) හෝ යම් ආයතනයක නර්තන ඉගැන්වීම හා ඊට අදාළව වසරක පළපුරුද්ද අවශ්‍ය වේ.

25. මනෝ විද්‍යා නිලධාරී (ලුතිනන්) ඃ

අ. ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයට අයදුම් කළ හැකිය.
ආ. අවිවාහක විය යුතුයි.
ඇ. 2024 නොවැම්බර් මස 08 දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුය.
ඈ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් දේශීය විශ්වවිද්‍යාලයකින් මනෝවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය සමත් වී තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත විදේශීය විශ්ව විද්‍යාලයකින් මනෝ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සමත් වී තිබීම.
ඉ. රජයේ රෝහලක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික රෝහලක/ආයතනයක මනෝ වෛද්‍යවරයෙකු ලෙස අවම වශයෙන් මාස 06 සේවයකර තිබීම.

26. සේවා කොන්දේසි ඃ

අ. අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් අදාළ වෘත්තීන්ට අනුව බඳවාගැනීමෙන් පසු මාස 04 ක කාලයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේදී යුද්ධ හමුදා මූලික පුහුණුවීම් පාඨමාලාවක් හැදෑරිය යුතුය.

ආ. යුද්ධ හමුදාධිපති තුමන් විසින් තීරණය කරනු ලබන පරිදි බඳවාගනු ලබන නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක රාජකාරි/පුහුණුවීම් සිදුකිරීමට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

ඇ. පුහුණුවීමේ කාලය තුළදී කෙඩෙට් නිලධාරීන්ගේ තරාතිරම සෙසුනිලයින් හා සමාන වන අතර, ඔවුන් යුද්ධ හමුදා නීතියට සහ සිවිල් නීතියට යටත් වනු ඇත.

ඈ. රාජ්‍ය සේවයේ දෙපාර්තුමේන්තු, සංස්ථා, සිවිල් ආයතනය හා පුද්ගලික ආයතනයන් හි නියුතු අයදුම්කරුවන්/අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් පූර්ණ කාලීනව යුද්ධ හමුදා සේවයට නිදහස් කළ හැකි බවට සහතිකයක්ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තු, සංස්ථා, සිවිල් ආයතනය) මගින් ඉදිරිපත් කළ යුතුය.

ඉ. වෘත්තීය නිලධාරීන් වශයෙන් බඳවාගනු ලබන නිලධාරී/නිලධාරිණියන් හමුදා නියෝග (12/2019) උපදෙස් හා වෘත්තීය නිලධාරී බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියේ සඳහන් සුදුසුකම් අනුව අදාළ නිලය සඳහා බඳවාගනු ලබයි.

ඊ. සියළු වෘත්තීය නිලධාරීන්/නිලධාරිනියන් බඳවා ගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරියට පත්කල දින සිට ඉදිරියට වසර 10 ක් සේවය කිරීමේ පදනම මත මුල්‍ය ඇපබැඳුම්කරයකට යටත් විය යුතුය.

උ. පාඨමාලාවෙන් ඉවත්වීම/ඉවත් කිරීම:

(1) පුහුණුවීම් කාලසීමාව තුළදී කෙඩෙට් නිලධාරියෙකු සිය කැමැත්තෙන්ම අධිකාරිය සඳහා වූ තම අපේක්ෂකත්වය අවසන් කළහොත් එතෙක් එම කෙඩෙට් නිලධාරියා වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය මඟින් දරන්නට යෙදුණු සියලුම වියදම භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(2) කෙඩෙට් නිලධාරියෙකු පාඨමාලාවේ නියුතුව සිටින කාලය තුළ කිනම් අවස්ථාවක හෝ විෂමාචාර හේතූන් නිසා අස්කිරීම, අයහපත් ආරක්ෂක නිශ්කාෂණ, තමන් විසින් වලක්වාලිය හැකි හේතූන් නිසා හෝ අධිකාරිය පිරිනැමීමට නුසුදුසු යැයි නිලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට යෙදුණු සියලුම වියදම් භාරකරු හෝ ඇපකරුවන් විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට ආපසු ගෙවිය යුතුයි.

(3) ඉල්ලා අස්වන ලද, ඉවත් කරන ලද හෝ වෛද්‍ය හේතූන් මත නුසුදුසු යැයි පුහුණුවෙන් ඉවත් කරන ලද කෙඩෙට් නිලධාරියෙකුට නැවත අවස්ථාවක යුද්ධ හමුදාව වෙත කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් බැඳීමට නොහැක.

27. **වැටුප් හා දීමනා.**-තෝරා ගනු ලබන අයදුම්කරුවන් හට පහත දක්වා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන්ට අදාළ වන වැටුප් තලයෙහි/පරිමාණයෙහි තබනු ලැබේ:

| අ/අ | නිලය | රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛ 3/2016 ට අනුව | | |
|---|---|---|---|---|
| | | ඒකාබද්ධ වැටුප 2020 වර්ෂයේ සිට | වැටුප් වර්ධක 2020.01.01 දින සිට | උපරිම ඒකාබද්ධ වැටුප |
| 1 | දෙවන ලුතිනන් | රු: 41,905.00 | - | - |
| 2 | ලුතිනන් | රු: 47,615.00 | 30 x 1335 (වාර්ෂික) | රු: 87,665.00 |
| 3 | කපිතාන් | රු: 55,625.00 | 24 x 1335 (වාර්ෂික) | රු: 87,665.00 |
| 4 | මේජර් | රු: 60,965.00 | 22 x 1335 (වාර්ෂික) | රු: 90,335.00 |
| 5 | ලුතිනන් කර්නල් | රු: 62,595.00 | 22 x 1630 (වාර්ෂික) | රු: 98,455.00 |
| 6 | කර්නල් | රු: 76,175.00 | 17 x 2170 (වාර්ෂික) | රු: 113,065.00 |
| 7 | බ්‍රිගේඩියර් | රු: 80,515.00 | 15 x 2170 (වාර්ෂික) | රු: 113,065.00 |
| 8 | මේජර් ජෙනරාල් | රු: 88,000.00 | 12 x 2700 (වාර්ෂික) | රු: 120,400.00 |
| 9 | ලුතිනන් ජෙනරාල් | රු: 93,400.00 | 10 x 2700 (වාර්ෂික) | රු: 120,400.00 |
| 10 | ජෙනරාල් | රු: 101,500.00 | 7 x 2700 (වාර්ෂික) | රු: 120,400.00 |

28. **අනෙකුත් දීමනා :**

අ. පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:

(1) සුදුසුකම් දීමනා,
(2) නොමිලේ ආහාර හෝ ආහාර දීමනාව,

(3) විසෙෂපණ දීමනාව (විවාහක නිලධාරින් කඳවුර ඇතුළත විසීමට නියෝග ලබා සිටින විට) විවාහක නිලධාරින්ට පමණක් හිමි වේ.

(4) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

29. පහත සඳහන් පහසුකම් සපයනු ලැබේ/දීමනා ගෙවනු ලැබේ :

අ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.
ආ. කුලී නිවාසයක වාසය කරන විට සීමිත ගෙවල් කුලී.
ඇ. නොමිලේ නිල ඇඳුම්.
ඈ. විවාහක නිලධාරින්ට අනුගාමික දීමනා/අවිවාහක නිලධාරින් අනුගාමික සේවය.
ඉ. ඇතුළත විසීමට නියෝග ලැබ සිටින නිලධාරින්ට රාජකාරි ස්ථානයේ සිට නිවස දක්වා මසකට වරක් රාජකාරි දුම්රිය බලපතක්.

30. වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි නිලධාරින්ට බලපවත්වනු ලැබේ :

අ. යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.

ආ. 1993 අගෝස්තු මස 17 වන දින අංක 780/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1992 යුද්ධ හමුදා නිලධාරි (නිත්‍ය බලසේනා) සේවා නියෝගය.

ඇ. 1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය.

31. මෙහි පහත 32 වැනි ඡේදයෙ හි දක්වා ඇති පරිදි දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ප්‍රකාශන පත්‍රයකට අත්සන් කළයුතු වන අතර, එය අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතු වේ. තෝරාගත් අපේක්ෂිකයින්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් එකී අපේක්ෂකයින් පත් කිරීමට පෙර ප්‍රකාශන පත්‍රයෙහි අඩංගු කරුණුවලට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයත් සමග ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතුය. විශේෂ අවස්ථාවලදී හැර පියා ජීවතුන් අතර සිටින කෙඩෙට් නිලධාරියෙකුගේ භාරකරු පියා විය යුතු අතර, ඔහු නොමැති නම් පමණක් මවට හෝ භාරකරුහට භාරකාරිත්වය හිමිවනු ලැබේ.

32. අයදුම්කරුගේ මව, පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෙඩෙට් නිලධාරි ඉල්ලුම්කරුවෙකු වන ................................................................................................ගේ පියා/මව/භාරකරු මම වෙමි.

ආ. ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම සඳහා ඉහත නම සඳහන් අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් මෙහි පහත සඳහන් කරුණු සම්බන්ධ වගකීම මම භාර ගනිමිඃ

(1) පුහුණුම්මේ කාලසීමාව තුළ දී අයදුම්කරුහට දරන්නටවන සියලුම පෞද්ගලික වියදම් දැරීමට.

(2) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු සිය කැමැත්තෙන් ම අධිකාරය අවසන් කළහොත්, ඔහු වෙනුවෙන් රජයට දැරීමට සිදු වූ සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට.

(3) පුහුණුව ලබන කාලය තුළ ඉහත නම සඳහන් අයදුම්කරු කිනම් අවස්ථාවක වුවත් (විෂමාචාරය හෝ ඔහුට තමන් විසින්ම වළක්වාලිය හැකි හේතුන් හෝ නිසා) අධිකාරිය ලැබීමට නුසුදුසු යැයි බලධාරීන් විසින් වාර්ථා කරනු ලැබුවහොත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය මගින් ඔහු වෙනුවෙන් දරන්නට වූ වැයකිරීම් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වෙත ආපසු ගෙවීමට.

* නොගැලපෙන වචන කපා හරින්න.

..........................................
මව/පියා/භාරකරුගේ අත්සන

නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :..........................................................................................................

දිනය :...................................
සාක්ෂිකරුගේ අත්සන :......................................
නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් :..........................................................................................................

33. *භාෂා අවශ්‍යතා.*-ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධිවිධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව තෝරාගත් අපේක්ෂකයින් ක්‍රියා කළ යුතුවේ.

34. *අනන්‍යතාවය තහවුරු කිරීම.*-අපේක්ෂකයින් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් හෝ තැපැල්පති විසින් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත සහ මෝටර් වාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද රියැදුරු බලපත්‍රය' පිළිගනු ලැබේ.

35. රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර තෝරා ගතහොත් එම අපේක්ෂකයා සේවයෙන් මුදවාලිය හැකි බවට සහතිකයක් ද සහිතව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුයි.

36. *ඉල්ලුම් පත්‍ර.*-ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්කරුගේම අත් අකුරින් ලියා **2024 නොවැම්බර් මස 16 දින 1200** පැයට හෝ ඊට පෙර ලැබෙන සේ 'පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ' යන ලිපිනයට එවිය යුතුවේ. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම් ඉහල කෙලවරේ 'යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ වෘත්තීය නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය' යනුවෙන් සඳහන් කල යුතුවේ. ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන අවසාන දිනයට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. මෙම මූලස්ථානය මගින් ඉල්ලුම් පත්‍ර නිකුත් කිරීමක් ද සිදුකරනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර සහ අයදුම්පත www.army.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

37. ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් එවිය යුතුය.

අ. උප්පැන්න සහතිකය.
ආ. දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමේ සහතික.
ඇ. පාසල් හැරයාමේ සහතිකය.
ඈ. ග්‍රාම නිලධාරි සහතිකය.
ඉ. පොලිස් නිශ්කාෂණ සහතිකය.
ඊ. උපාධි සහතිකය.
උ. වෘත්තීය පලපුරුද්ද පිළිබඳ සහතිකය.
ඌ. ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.
එ. අයදුම්කරු පිළිබඳ දන්නා (චරිත සහතිකයක් නිකුත් කල හැකි අයෙකුගෙන්) පුද්ගලයින්ගෙන් මෑතක දී ලබාගන්නා ලද චරිත සහතික යටත් පිරිසෙන් දෙකක් හා අයදුම්කරු අවසානවරට ඉගෙනීම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබාගන්නා ලද චරිත සහතිකයක් තිබිය යුතුවේ.
ඒ. අදාළ වෙනත් සහතික.
ක. තව ද, ජාතික හැඳුනුම්පතෙ හි ඡායා පිටපතක් ද මෑතක දී ලබාගත් 2'x2x1/2" ප්‍රමාණයේ ඡායාරූපයක් ග්‍රාම නිලධාරි හෝ නීතිඥවරයෙකු විසින් සහතික කර එවිය යුතුය.

38. *සම්මුඛ පරීක්ෂණයන් පැවැත්වීම.*- ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් යුද්ධ හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණ වලට පෙනී සිටිය යුතුයි. ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම් කරනු ලැබේ.

39. තේරීම් මණ්ඩලය මගින් සම්මුඛ පරීක්‍ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය විද්‍යුත් ලිපියක් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය කොළඹ දී පවත්වනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් හෝ වෙනයම් වියදම් කිසිවක් ශ්‍රී ලංකා ජනරජය මගින් ගෙවනු නොලැබේ.

40. අයදුම්කරුවෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවෙකු තෝරාගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සහ දැරීම අපේක්‍ෂකයා නුසුදුස්සෙකු වනු ඇත.

41. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන් වෙත ඒ බව දන්වනු නොලැබේ. එවැනි අයදුම්කරුවන්ගෙන් ඒ පිළිබඳ කරුණු සැලකිරීම භාරගනු නොලැබේ.

*සටහන* : මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

එච් එල් වී එම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර,
කොළඹ,
2024 ඔක්තෝබර් මස 21 වැනි දින.

11-135/2

---

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

(කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

තනතුර : අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) තනතුරු 01

1. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 25 ට නොඅඩු හා 50 ට නොවැඩි විය යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන්**

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

ආ. රාජ්‍ය සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර (15) සමාජ වැඩ අධ්‍යාපන කළමනාකරණ අංශයන් හි පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ අධ්‍යාපන කළමනාකරණ සේවා ගණයේ තනතුරක I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබීම.

3. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය ඃ

| | *නිර්නායකය* | *ලකුණු* |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| 2 | අදාළ අතිරේක පළපුරුද්ද | 30 |
| 3 | වෙනත් කුසලතා | 15 |
| 4 | සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | 25 |
| | **එකතුව** | **100** |

4. වැටුප් පරිමාණය ඃ HM 1-3 -(රු.86,865-15X2,270- රු.120,915).

5. තනතුර සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි ඃ

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
2. තනතුර ස්ථිරය.
3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**සටහන** : මෙම තනතුර පුරප්පාඩුව පවතින්නේ සීදුව ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරා ගන්නා අය ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු ය.

සේවා කොන්දේසි : 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත ලිපිනයට **2024.11.22 දින** හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*)
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2024 නොවැම්බර් මස 04 වැනි දින,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*),
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදුව.

11-171

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2024 සැප්තැම්බර්

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, එනම් වසර දෙකක කාලයක් ඇතුළත හා දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් ස්ථිර කිරීමට පෙර එකී පත්වීම් දින සිට තෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය ***2024.12.21 වැනි දින*** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරින් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරින්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, ''සුවසිරිපාය'', කොළඹ 10, යන ලිපිනයට **2024.11.20** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. **ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහාවන දෙපාර්තමේන්තු විභාගය - 2024 සැප්තැම්බර්'' ලෙස සඳහන් කළ යුතුය. මෙම දෙපාර්තමේන්තු විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපිගොනු භාර නිලධාරියා විසින් ද, සෑම අයදුම්පත්‍රයක ම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතිකකර තිබීම අනිවාර්ය වේ.** තම අයදුම්පත සමග රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර (01) ක් ද එවිය යුතු ය. **(ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද අසම්පූර්ණ හෝ වැරදි සහිතවන අයදුම්පත් ද කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.)**

*සැ. යු* **: ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය** A4 **වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25.00 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිඳු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(*අ*) ජාතික හැඳුනුම්පත

(*ආ*) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත

(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය

(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක් ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරුකර විභාගයට පෙනී සිටිය හැකිය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතුය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(වෙබ් අඩවිය-www.health.gov.lk)

06. *විභාග පරිපාටිය* :

මෙම විභාගය ලිඛිත, රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100ක් බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබාගත යුතු ය. එක් වරක දී හෝ කිහිප වරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. නිලධාරින් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂයය නිර්දේශ මාලාව* :

07:1 **ලිඛිත විභාගය** :

07:1:1 **ආයතන සංග්‍රහය ප්‍රශ්න පත්‍රය**

කාලය පැය 02 යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

***විෂයය නිර්දේශය*** :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි,

(iii) ආයතන සංග්‍රහය

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,

II කොටස — XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්.

07:1:2 *රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය* : කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

***විෂයය නිර්දේශය*** :
**සෞඛ්‍ය සේවා සංග්‍රහය** -

(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමනාකරණය
(iii) ඖෂධ කළමනාකරණය

07:1:3 **ගිණුම් ප්‍රශ්න පත්‍රය** :

කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

***විෂයය නිර්දේශය*** :

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි;

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළකරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස;

(iii) වෛද්‍ය නිලධාරින් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ 124, 125, 126, 127, 128, 131, 133, 134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ 715, 716, 756, 757, 758 |

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

1 වැනි පරිච්ඡේදය - සියළුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 **සිංහල/දෙමළ වාචික පරීක්ෂණය** :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරින්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරින්ට සිංහල මාධ්‍යයෙන් ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්‍ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. ***විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම*** :

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක

සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීම ද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතුය. තවද, ජංගම දුරකතන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අදාළ නිලධාරින්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

*සැ. යු.*- මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයන් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

වෛද්‍ය පී. ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2024 නොවැම්බර් මස 05 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය'',
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ආදර්ශ අයදුම්පත**

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2024 සැප්තැම්බර්**

01 (*අ*) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

(*ආ*) (i) නිල නාමය (අදාළ කොටුව තුළ (✓) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරි : ☐ II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි : ☐

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය : ☐ ආයතන සංග්‍රහය ☐ ගිණුම් ☐

සිංහල වාචික ☐ දෙමළ වාචික ☐

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න.) :

සිංහල ☐ ඉංග්‍රීසි ☐ දෙමළ ☐

04. (අ) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :————.

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට : ☐

පළාත් සභාවට : ☐

(ආ) (i) පළාත් සභාවට නම් අදාළ පළාත :————.

(ii) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) (i) ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(ii) විද්‍යුත් ලිපිනය :————.

(ඈ) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

(ඉ) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ (✓) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම් කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | හම්බන්තොට | | අම්පාර | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | | වව්නියාව | |
| කුරුණෑගල | | අනුරාධපුර | | රත්නපුර | | පොළොන්නරුව | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | | ත්‍රිකුණාමලය | |

(ඊ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 110.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 01ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :————.

(උ) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) :————.

(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.

(ආ) විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :————.

| මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.) |
|---|

06. *අයදුම්කරුගේ සහතිකය ඃ*

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්, ප්‍රථම වතාවට නොවන බැවින් රු ..... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. *පෞද්ගලික ලිපිගොනු භාර විෂයය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය*

මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර/පසු මා වෙත භාරදුන් බවත්, මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදි ව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

————,
නම සහ අත්සන.

දිනය :————.

08. *ආයතන ප්‍රධානියාගේ සහතිකය*

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවට ද රු. .................. ක් වටිනා මුද්දර මෙම මුද්දර අයදුම්පත්‍රයට අලවා ඇති බව ද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද, මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

දිනය :————.

09. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය*

.......................... මහතා/මහත්මිය/මෙනවිය වෛද්‍ය නිලධාරියකු/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :————.

* (අනවශ්‍ය කොටස් කපා හරින්න)

11-181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.